# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 160/44 — 1975 අප්‍රේල් 19 වැනි සෙනසුරාද — 1975.04.19

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

ජනා. කා. අංකය : ඩබ්ලිව්. 68(50)/75.

**මහාජන ආරක්ෂක ආඥාපනත (40 වන අධිකාරය)**

අගමැතිගේ නිර්දේශය අනුව (40 වන අධිකාරය වූ) මහාජන ආරක්ෂක ආඥාපනතේ 5 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලැබූ නියෝගය.

**වි. ගොපල්ලව,**
**ජනාධිපතිවරයා.**

**1975 අප්‍රේල් මස 19 වන දින,**
**නුවරඑළිය, ජනාධිපති කාර්යාලයේ දී ය.**

**නියෝගය**

වෙන යම් ලිඛිත නීතියක කුමක් සඳහන්ව ඇත ද, මෙහි වූ උපලේඛනයෙහි I වන තීරයේ නිශ්චිතව සඳහන් එක් එක් මහ නගර සභාවේ කටයුතු පිළිබඳ පරිපාලනය, එකී උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහනේ සඳහන් එක් එක් තැනැත්තා වෙත, මෙම නියෝගය බලපවත්වන තාක් හා ඒ තාක් පමණක් 1975 ජනවාරි මස 1 වන දින සිට පැවරෙන්නේ ය ; තවද, ඒ අනුව ඒ එක් එක් මහ නගර සභාවේ කටයුතු පිළිබඳ පරිපාලනය පැවරී ඇති තැනැත්තා විසින් ඉහත කී කාල පරිච්ඡේදය තුළ මහ නගර සභා ආඥාපනත මගින් හෝ වෙන යම් ලිඛිත නීතියක් මගින් මහ නගර සභාවක් සහ එහි නගරාධිපති වෙත පවරා ඇති බලතල ක්‍රියාත්මක කිරීම හා නියම කර ඇති කාර්ය ඉටු කිරීම කළ යුතුය.

### උපලේඛනය

| I තීරය | II තීරය |
| --- | --- |
| මීගමුව මහ නගර සභාව ... | ... තුගේගොඩගේ දොන් නිකොලොස් ගුණසේකර |
| දෙහිවල-ගල්කිස්ස මහ නගර සභාව | ... ෂ්‍යාමන් සපුමල් අල්විස් ජයසිංහ |
| ගාල්ල මහ නගර සභාව ... | ... රෝලන්ඩ් ඩයස් අබේසිංහ |


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

117A—ඒ 13670—2,100 (75/04)